# ස්වේච්ඡා ඉඩම් පරිත්‍යාග කිරීමේ ක්‍රියාවලිය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, කෘෂිකර්ම අමාත්‍යාංශය.

ප්‍රතිපත්තිමය වශයෙන් ස්වේච්ඡාවෙන් ඉඩම් පරිත්‍යාග කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් දිරිමත් නොකරන නමුත්, ප්‍රජා පදනම් කරගත් සංවිධාන, ගොවි නිෂ්පාදන සංවිධාන සහ ව්‍යාපෘති කටයුතුවලට සහභාගී වන අනෙකුත් ප්‍රාදේශීය ආයතන වලට ප්‍රතිලාභීන්ගෙන් ස්වේච්ඡාවෙන් ඉඩම් පරිත්‍යාග ලබා ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අයිතියක් ඇත. ස්වේච්ඡාවෙන් ඉඩම් පරිත්‍යාග කිරීමේ දී ව්‍යාපෘතිය මඟින් පහත සඳහන් දෑ සහතික කෙරේ:

- ස්වේච්ඡා පරිත්‍යාගයෙන් ලබා ගන්නා ඉඩම කිසිදු ඉදිකිරීමකින් හෝ වෙනත් වත්කම් වලින් තොර විය යුතු බව.
- ස්වේච්ඡා පරිත්‍යාගයෙන් ලබා ගන්නා ඉඩමේ ප්‍රමාණය අයිතිකරු සතු මුළු ඉඩමෙන් 10% ට වඩා අඩු විය යුතු අතර එමගින් ඉඩම අයිතිකරුගේ ජීවනෝපාය කෙරෙහි අහිතකර ලෙස බලපෑමක් නොමැති බව.
- ඉඩම් පරිත්‍යාගය ස්වේච්ඡාවෙන්ම සිදුකරන බව සම්පූර්ණයෙන්ම හා ස්වාධීනව තහවුරු කිරීම.
- පරිත්‍යාගශීලීන් කෙරෙහි ඇති වන බලපෑම ආන්තික වීම, එනම්, පරිත්‍යාග කරන්නාගේ ඉඩම් ප්‍රමාණයෙන් සියයට 10 කට වඩා වැඩි ප්‍රමාණයකට සම්බන්ධ නොවන අතර පරිත්‍යාග කරන්නා නැවත පදිංචි කිරීමකට ලක් නොවන බව.
- ඉඩම, පදිංචි කරුවන්ගෙන්, කුලී නිවැසියන්ගෙන්, භෝග වලින් හෝ වෙනත් යැපෙන්නන්ගෙන් සහ ගැටුම්කාරී හිමිකම් වලින් තොර වීම.
- ඉඩම් පරිත්‍යාග කරන්නාගේ ඉතිරි වත්කම් ජීවනෝපාය සහ පදිංචිය සහතික කිරීම සඳහා ආර්ථිකමය වශයෙන් ප්‍රමාණවත් බව.
- ප්‍රාදේශීය/ප්‍රජා මට්ටමේ දුක්ගැනවිලි නිරාකරණ ක්‍රමයක් පවතින බව.
- ඉඩම් නීත්‍යානුකූල ක්‍රියාවලියක් මඟින් පවරන බවට ගිවිසුම් ගතවීම.

ප්‍රජාව පදනම් කරගත් ක්‍රියාමාර්ග මේ සඳහා පිළිගත හැකි අතර ව්‍යාපෘති කටයුතු සඳහා ඉඩම භාවිතා කිරීමට අවසර ලබා දෙමින් ඉඩම් හිමියාගෙන් අවසර පත්‍රයක් ලබා ගත යුතුය. ඒ සඳහා පරිත්‍යාග කරන ලද ඉඩම් පිළිබඳ විස්තර ඇතුළත් නීතිමය ගිවිසුමක් ඉඩම් හිමියාගේ/උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ විධිමත් අනුමැතිය සහිතව අත්සන් කල යුතුය.

ඉඩම් පරිත්‍යාගය පිළිබඳ නීතිමය එකඟතාව සඳහා වන ආකෘතිය ඇමුණුම I හි දක්වා ඇත.

ඉඩම් පරිත්‍යාග කිරීම නිසා සිදුවන බලපෑම අවම ද යන්න තහවුරු කර ගැනීම සඳහා උප ව්‍යාපෘති භූමියට පැමිණ ඉඩම් පරිත්‍යාගශීලීන්ගෙන් සහ අනෙකුත් ප්‍රාදේශීය පාර්ශවකරුවන්ගෙන් ඉඩම් පරිත්‍යාග කිරීම සම්බන්ධයෙන් හා ඉහත කොන්දේසි සපුරාලන බවට සහතික වීම සඳහා පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල වගබලා ගතයුතුය.

## ඇමුණුම I: ස්වේච්ඡා ඉඩම් පරිත්‍යාග සඳහා නීතිමය ගිවිසුම සඳහා වූ ආකෘතිය.

පහත සඳහන් එකඟතාවය ............. දින .............. දිස්ත්‍රික්කයේ ........... ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ…………. ග්‍රාම නිලධාරි වසමෙහි ………… ...... ලිපිනයේ පදිංචි........................ වියැති..................... මහතා අතරය.

1. ................ලියාපදිංචි අංකය දරණ ඉඩමට නැගෙනහිර දිසාවෙන් ............................... බටහිර දිසාවෙන් ................................ උතුරු දිසාවෙන්, .................................. සහ දකුණු දිසාවෙන් ...... ........................... පිහිටා ඇත.

2. ඉඩමේ අයිතිකරු සතුව පැවරිය හැකි ...................................... .... ඉඩම් ප්‍රමාණයක් ඇති අතර,

3. ඉඩම නීත්‍යානුකූල නොවන අත්පත් කරගැනීම් වලින්තොර වන අතර වෙනත් කිසිදු හිමිකම් පෑමකට යටත් නොවන බවට අයිතිකරු සාක්ෂි දරණ බවද,

4. මෙමගින් හිමිකරු ස්වෙච්ඡාවෙන් ................. ග්‍රාම නිලධාරි වසමෙහි පිහිටි................... (ඉඩම් ප්‍රමාණය) මෙම වත්කම දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘති ආධාර මත ඉදිකරන සහ සංවර්ධනය කරන ................... ව්‍යාපෘතිය සඳහා ප්‍රජාවගේ ප්‍රයෝජනය පිණිස ලබා දෙන බවද,

5. මෙම වත්කම ලබා දීමට එරෙහිව අයිතිකරු කිසිදු වන්දි මුදලක් ඉල්ලා නොසිටින අතර නීති හා රෙගුලාසි අනුව ඉඩමේ ඉදිකිරීම් ක්‍රියාවලියට බාධා නොකරන බවට එකග වීම.

6. වත්කම් මාරු කිරීමේ ස්වෙච්ඡා ස්වභාවය මත මෙම වත්කම් ප්‍රදානය සිදු වූ බවට පිළිගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය/කෘෂිකර්ම අමාත්‍යාංශය එකඟ වීම.

උප ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන.......... ...... ...... මගින් ව්‍යාපෘතිය යටතේ යටිතල පහසුකම් ඉදි කර සංවර්ධනය කළ යුතු අතර යාබද ඉඩමට/ඉදිකිරීම් වලට හානි වීම වැළැක්වීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගත යුතුය.

7. මෙම ගිවිසුම අත්සන් කළ දිනයේ සිට මෙම ගිවිසුමේ විධිවිධාන බලාත්මක වන බව.

| | |
|---|---|
| ................................ | .................................... |
| අත්සන | අත්සන |
| (ඉඩමේ හිමිකරු) | (ග්‍රාම නිලධාරීගේ) |

.......................................................

අත්සන

ප්‍රාදේශීය ලේකම්/ සභාපති, පළාත් පාලන ආයතන

| | |
|---|---|
| සාක්ෂිකරු: 1 ……………………………… | ...................... |
| (නම) | (අත්සන) |
| සාක්ෂිකරු: 2 ………………………......... | ........................ |
| (නම) | (අත්සන) |